# කතා කරන ඔරලෝසුව




නෙතුෂි සෙහන්සා හේරත්

කෘතියේ නම - කතා කරන ඔරලෝසුව

ප්‍රථම මුද්‍රණය - 2025.02.08

කතාව සහ චිත්‍ර - නෙතුෂි සෙහන්සා හේරත්

කතෘගේ ලිපිනය - අංක 179/21,
පට්ටියකැලේ වත්ත,
අම්පිටිය


කතෘගේ වෙනත් කෘති- වලස් පැංචා
මගේ පුංචි කාසි කැටේ

පාසල - මහමායා බාලිකා විදුහල

ශ්‍රේණිය - 2 ශ්‍රේණිය B

පරිගණක අක්ෂර හා පිටු සැකසුම : ඕෂධී එන්ටර්ප්‍රයිසස්,
2 G,
සිගෝ ප්ලාසා,
තලාතුඔය.

ISBN: 978-624-208-452-7




# පිදුම

මගේ ආදරණීය

මහමායා බාලිකා අම්මාට

මෙම පොත

ආදරයෙන් පුදමි.



# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමුකරන

**''හෙරණගත්කරණි''** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.


විදුහල්පතිනිය,

ශශිකලා සේනාධිර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර



එකොමත්
එක
කාලෙක
මලිත්
කියලා
ළමයෙක්
හිටියා.
එයාට වයස
අවුරුදු 11 යි.



ඉතින් එක දවසක්
මලිත් ඔරලෝසුව
ළඟට ගියා.






''ඇයි ඔයා හැම
වෙලාවේ ම ටක් ටක්
ගාන්නේ''
මලිත් ඇහුවා.
''මගේ ඇඟේ ඉන්න
තත්පර
කට්ට හරිම දඟයි. එයා
හැම වෙලාවේ ම කෑ
ගසනවා.''
ඔරලෝසුව කිව්වා.





‘‘ඔයාගේ නම මොකක්ද?’’ මලිත් ඇසුවා.

‘‘මගේ නම ඔරලෝසුව’’




‘‘ඔයාගේ නම
මොකක්ද?’’ ඔරලෝසුව
ඇසුවා.
මගේ නම මලිත්.’’




“ඔයාගේ ඇගේ ඉන්න අනිත් දෙන්නා කවුද?”

මලිත් ඇසුවා.

“එක්කෙනෙක් පැය කටුව, අනිත් එක්කෙනා


මිනිත්තු කටුව” ඔරලෝසුව කිව්වා.



''මට නම් ඉන්නේ අක්කයි, නංගියි.''
මලිත් කිව්වා.

''ඔයා එයාලට ගොඩක් ආදරෙයිද?''
ඔරලෝසුව ඇසුවා.

''ඔව්. මම එයාලට
ගොඩක් ආදරෙයි.''
මලිත් කිව්වා.



‘‘මගේ ඇගේ ඉලක්කම් 12 ක්

තියනවා. එයාලා මගේ යාළුවෝ.’’

ඔරලෝසුව කිව්වා.


‘‘ඔයාට යාළුවෝ ගොඩක් ඉන්නවා නේද?’’

මලිත් ඇසුවා.


‘‘ඔව් මට යාළුවෝ ගොඩක් ඉන්නවා.

ඔයාටත් යාළුවෝ ගොඩක් ඉන්නවද?’’

ඔරලෝසුව ඇසුවා.



‘‘ඔව්, මටත් ගොඩක් යාළුවෝ ඉන්නවා.
මනුක, සිරිමල්, සනිත්, සන්දිස.’’ මලිත් කිව්වා.



"ඇයි ඔයා බිත්තියේ නැගලා ඉන්නේ. ඔයා වැටෙයිනේ." මලිත් කිව්වා.

"මම මෙතන හිටියොත් ඔයාලට වෙලාව බලන්න පුළුවන්." ඔරලෝසුව කිව්වා.


''ස්තූතියි ඔරලෝසු
යාළුවේ...!''
ස්තූතියි



නෙතුෂි සෙහන්සා හේරත්

2 ශ්‍රේණිය B

මහමායා බාලිකා විද්‍යාලය

මහනුවර

පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළි දැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව (2014) වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්විමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,

සෙනෙවිරත්න මහලේකම්

ISBN: 978-624-208-452-7